# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2015

(නව නිර්දේශය)

2021 මාර්තු - 2022 ජනවාරි

මානවශාස්ත්‍ර පීඨය

සිංහල

සිංහල ගද්‍ය සාහිත්‍යය, නාට්‍ය හා සිනමාව SINH E – 2015

එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

I කොටස

01. පහත සඳහන් ඡේදවල අදහස ලිහිල් බසින් ලියා අවස්ථා නිරූපණ කුසලතාව පිළිබඳ ඇගයීමක් කරන්න.

(අ) සැවැත් නුවර සතළිස් කෙළක් විවර වස්තු ඇති සිටාණ කෙණෙකුන්ගේ දුවණි කෙණෙක් ඇත. මනහර වූ රූ ධරති. උන් සොළොස් හැවිරිදි වයස දී මිථ්‍යාචාරයෙන් නවතනු නිසා සත්මල් පායේ උඩු මාලේ ශ්‍රී යහන් ගබඩාවෙක ලා රකිති. එ සේ වුව ත් උං තුමූ තමන්ගේ ම ගෙයි කොල්ලකු හා බැඳී වෙසෙති. උන්ගේ දෙ මවුපියෝ ජාතීනු ත් සම්පත්තීනු ත් සම තරම් වූ සිටු පුත්‍රයාණ කෙනෙකුන්ට සරණ දෙන්නට නියම ව දවස් නියම කළහ. නකත් දවස් උදාවූ කලට සිටු දුවණියෝ බැඳි වසන කොල්ලාට කියන්නෝ 'මං අසවල් දවස් අසවල් සිටු පුත්‍රයාණන්ට සරණ දෙති. මා උන් කරා සරණ ගිය කල පඬුරක් හැර ගෙන ගිය නමුත් ඔබිනු ත් වෙන ම රකවල් හෙයින් දක්නා පමණකට ත් නො ලබව. ඉදින් මා කෙරෙහි ප්‍රේමයෙක් ඇත් නම් ඔබ නො යන තෙක් දැන් ම මා කැඳවා ගෙන කැමති තැනකට යව' යි කීවූ ය. උයි ත් යහපතැ යි ගිවිස එ සේ වී නම් මම සෙට දවස් නුවර වාසල කෙරේ අසවල් තැන සිටිමි. මුඹ ත් එක් උපදෙසකින් කාට ත් නො හැඟෙන ලෙස එ තැනට අව මැනවැයි කියා ලා දෙවන දවස් කියා ලූ තැන ම සිටියහ.

(ආ) නාරද තවුසෝ පෙරළා ගෙට වදනා ගමනේ 'ආදි මේ කන්තෙන් අවුත් හිස මිරිකා පීමි. මෙ විට පා මුලින් යෙමි. එ සේ කලට මැඩී ගියේ නමුත් අතින් වුව'ත් මැඩිය යුතු වූ පය මැඩියෙ යි හිස් දොරින් ගොසින් පෙරළා ත් හිස මැ - ගියේ නම් ක්ෂමා කරවන්නට

ත් බැරි ලෙසින් කොපය තර වෙයි. පා මුලින් යෙමි' යි සිතා යන්නෝ තමන් දැ නො වරදනා බව මුත් අර මුන් කොට වරද්දන හෙයින් වර පෙරැළි ව වැද හොත්තා වන්නා බැණ නැඟ නො දෙන්ට කළාක් මෙන් බොටුව මැඩ පියා කවුරුදැ යි විචාළ කල්හි 'ආචාරිනී, මම ය' යි කීවු ය. 'හැයි සොර දුළුල්ල, පළමු දොරට නික්මෙන ගමනේ ත්, හිස මිරිකා ගෙන ගොසින් පෙරළා එන ගමනේත් නිමවන්ට කරන්නාක් මෙන් බොටුව මිරිකා ගෙන යෙ යි. සැතපෙන්ට අවසර දුන්නේ වරද වී නම් ඒ හැර මා ගේ අනික් වරද කවරේ ද? තෙල ලෙස ම දුෂ්ට කම් කරණ කල තට හැවිල්ලක් හවමි' යි දෙවළ තවුසෝ කිවූ ය.

02. පොළොන්නරු යුගය සිංහල බණකථා සාහිත්‍යයේ ආරම්භක අවධිය ලෙස සැලකීම කෙතෙක් දුරට යුක්ති යුක්ත දැයි නිදසුන් ඇසුරෙන් පහදන්න.

03. බුත්සරණෙහි ඇතුළත් භක්ති කාව්‍යය ලක්‍ෂණ පිළිබඳ ඇගයීමක් කරන්න.

<u>නැතහොත්</u>

ධර්මසේන හිමියන්ගේ සද්ධර්මරත්නාවලීහි කතා කලාවේ සුවිශේෂතා පිළිබඳ විමසීමක් කරන්න.

## II කොටස

04. චරිත නිරූපණයෙහිලා බැද්දේගම නවකතාකරුවා දැක්වූ සුවිශේෂ කුසලතාව සනිදර්ශනාත්මක ව සාකච්ඡා කරන්න.

05. "මාර්ටින් වික්‍රමසිංහගේ තුන් ඈඳුතු නවකතා මගින් සමාජ විපරිණාමයේ යථාස්වභාවය කලාත්මක ව සාකච්ඡාවට භාජනය කෙරේ." විමසන්න.

06. පහත සඳහන් කෙටිකතා අතරින් එකක් පිළිබඳ විචාරාත්මක විග්‍රහයක් කරන්න.
   (අ) දියමන්ති මාලය
   (ආ) ස්ටෙප්ස් තණ බිමෙහි දී
   (ඇ) නිල් මැස්සා
   (ඉ) ක්‍ෂත්‍රිය ධර්මය

## III කොටස

07. සකුන්තලය භාරතීය ප්‍රභූ සමාජය විවේචනයට භාජනය කෙරෙන කෘතියක් ලෙස හැඳින්වීම කෙතෙක් දුරට යුක්ති යුක්ත දැයි විමසන්න.

08. ඇරිස්ටොෆනීස්ගේ මැඩියෙර නාට්‍ය මගින් නිරූපණය වන සමකාලීන සමාජ යථාර්ථය පිළිබඳ විග්‍රහයක් කරන්න.

09. "චිත්‍රපටය වඩාත් සමීප වන්නේ වේදිකා නාට්‍යයට නොව නවකතාවට ය." විභාග කරන්න.

10. ධර්මසේන පතිරාජගේ පාරදිගේ චිත්‍රපටය සිංහල සිනමාවේ සන්ධිස්ථානයක් ලෙස සැලකීම කෙතෙක් දුරට යුක්ති යුක්ත දැයි නිදසුන් ඇසුරෙන් පහදන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගිනි)

****************************************